**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (උමාසව්‍යා) - මුල් විෂය පථය හා අතිරේක මූල්‍යයනය -2013**

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ ( උ මා ස ව්‍යා ) මුල් විෂය පථය හා අතිරේක මූල්‍යයනය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ( ශ්‍රී ලං ර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආ සං බැ ) අතර 2010 අගෝස්තු 27 දින එළඹි අංක 2639-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV වැවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහා මාර්ග , වරාය හා නාවික අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මට්ටමින් ව්‍යාපෘති කාර්යයන් කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වගකිව යුතු වේ. වැඩිදියුණු කිරීම් සඳහා අත්‍යවශ්‍ය ලෙස හඳුනාගත් උතුරු පළාතේ හා උතුරු මැද පළාතේ කිලෝ මීටර් 170 ක ජාතික මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව , ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ ජ ඩො මිලියන 146 ක් වන අතර එයින් එ ජ ඩො මිලියන 130 ක් හෙවත් සියයට 89 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, ශ්‍රී ලංකා රජයේ 2010 සංවර්ධන රාමුව යටතේ උතුරු පළාතේ සහ උතුරු මැද පළාතේ ජාතික මාර්ග කිලෝමීටර් 280 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ආසියානු සංවර්ධන බැංකුව සමඟ එජඩො මිලියන 30 ක් සහ විගැහි 45,215,000 ( දළ වශයෙන් එජඩො මිලියන 68 ) ක අතිරේක මූල්‍යයනය සඳහා පිළිවෙලින් ණය අංක 2890 එස්ආර්අයි (එස්එෆ්) සහ අංක 2891 එස්ආර්අයි යටතේ ණය ගිවිසුම් දෙකක් ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව විසින් අත්සන් කර තිබුණි. 2010 ඔක්තෝබර් 22 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය. අතිරේක මූල්‍යයන සැලසුම් යටතේ කාර්යයන් 2013 අගෝස්තු 28 දින ආරම්භ කරන ලද අතර, 2015 පෙබරවාරි 25 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්

කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීමද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතිය මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය , ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඉ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතින් වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණු බව,

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වී ඇති බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.4,483,868,313 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.12,719,480,889 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම් හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| කාර්යාලීය උපකරණ | 447,800 | 334,007 | 1,137,665 |
| වැඩ පූර්ව අත්තිකාරම් | 1,113,942,317 | - | 1,113,942,317 |
| කොන්ත්‍රාත් ගෙවීම් | 3,095,364,158 | 7,172,837,255 | 10,788,606,116 |
| අධීක්ෂණ උපදේශක | | | |
| - ජාතික මහා මාර්ග | 105,021,593 | 184,198,978 | 301,691,572 |
| - පළාත් මාර්ග | 69,070,800 | 133,418,072 | 282,041,894 |

| | | | |
|---|---|---|---|
| සමීක්ෂණ / පරීක්ෂණ ගාස්තු | 1,413,186 | 300,000 | 2,766,562 |
| වර්ධක වියදම | 38,329,921 | 34,412,665 | 97,623,710 |
| පොලී / බැඳීම් ගාස්තු | 60,278,538 | 47,915,286 | 131,671,053 |
| | ----------------- | ------------------ | --------------------- |
| | 4,483,868,313 | 7,573,416,263 | 12,719,480,889 |

**4.2 අග්‍රිම අරමුදල් ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුම්වල මෙහෙයුම් හා එදිනට එම ගිණුම්වල පැවති ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | ණය අංක 2639 | | ණය අංක 2890 | |
|---|---|---|---|---|
| | එජඩො | රු. | එජඩො | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 11,690.81 | 1,486,613 | 150,000.00 | 19,665,000 |
| එකතු කළා :- ඌනපූර්ණයන් | 304,565.22 | 39,180,500 | - | - |
| | ----------------- | --------------- | --------------- | ---------------- |
| | 316,256.03 | 40,667,113 | 150,000.00 | 19,665,000 |
| විදේශ විනිමය වාසිය / (අවාසිය) | - | 211,078 | - | (35,887) |
| | ----------------- | --------------- | --------------- | ---------------- |
| | 316,256.03 | 40,878,191 | 150,000.00 | 19,629,113 |
| අඩුකලා :- ආපසු ගැනීම් | (268,323.82) | (34,610,910) | (61,881.11) | (8,107,304) |
| | ----------------- | --------------- | --------------- | ---------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 47,932.21 | 6,267,281 | 8,118.89 | 11,521,809 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ණය අංක 2890 එස්ආර්අයි හා ණය අංක 2891 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම් යටතේ අතිරේක මූල්‍යයන සැලසුම් සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු අතර, අදාළ ණය ගිවිසුම් යටතේ සිදුකළ ගනුදෙනු ඒකාබද්ධ කර මෙම ව්‍යාපෘතිය යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.11,599,596,673 ක් වූ කෙරීගෙන යන සිවිල් වැඩ ඉංජිනේරුවන් විසින් සහතික කරන ලද තථ්‍ය වැඩ වටිනාකම වෙනුවට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද මුදල්වලින් පමණක් නියෝජනය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.4 අනුව, කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්කරු හා උපදේශකවරුන් විසින් මිලදී ගන්නා ලද වත්කම් ව්‍යාපෘති වියදම් ලෙස සලකා තිබුණු අතර දේපල, පිරියත හා උපකරණ ලෙස දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. එබැවින් රු.137,665 ක් වටිනා වත්කම් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ඉංජිනේරුවන් විසින් අනුමත කරන ලද විචලන නියෝග යටතේ නිම කරන ලද රු.2,365,532 ක් වටිනා කාර්යයන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 ඡේද ප්‍රකාරව ව්‍යාපෘතිය සඳහා මුදා හරින ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් ප්‍රසාද දීමනා හා වෛද්‍යාධාර දීමනා සඳහා හිමිකම් නොමැති වුවද, රු.258,892 ක් වූ එවැනි දීමනා එම සේවකයන්ට ගෙවා තිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ සේවය කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් සඳහා, මූල්‍ය ප්‍රකාශනවල රු.409,746 ක්වූ පාරිතෝෂික ප්‍රතිපාදන සිදුකර තිබුණි. මෙය ව්‍යාපෘතියේ සේවා කාල පරිච්ඡේදයට ගණනය කිරීම වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරියේ මුළු සේවා කාල පරිච්ඡේදයටම ගණනය කිරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදනය වැඩියෙන් දක්වා තිබුණි.

(උ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයක් පදනම් කර ගෙන ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් සඳහා වැටුප් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන්, 2013 දෙසැම්බර් 31 දක්වා වැටුප් ලෙස රු.19,928,802 ක මුදලක් ඉහත උපදෙස් අනුගමනය කිරීමෙන් තොරව ගෙවා තිබුණි.

(ඌ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.3.9 ඡේදය යටතේ විධිවිධානවලට පටහැනිව, පොදු කාර්ය පිරිවැය හා එකතු කළ අගය මත බදු ලෙස රු.1,117,149 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය සඳහා බදු ගෙවීම් නිදහස් කිරීමක් අනුමත කර තිබූ බව නිරීක්ෂණය විය.

(එ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයෙහි දක්වා ඇති පරිදි යම් කොන්ත්‍රාත් කාර්යයක් සඳහා වැඩ පූර්ව අත්තිකාරම්, තාවකාලික මුදල් හා අසම්භාව්‍යයන් හැර කොන්ත්‍රාත් මුදල මත ගෙවිය යුතුය. කෙසේ වුවද ඉහත උපදෙස් වලට පටහැනිව තාවකාලික මුදල් හා අසම්භාව්‍යයන් ඇතුළත්ව රු.1,659,000 ක් වැඩ පූර්ව අත්තිකාරම් ගෙවා තිබුණි.

(ඒ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ සඳහා එකතුව රු.84,766,089 ක් වූ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වියදම් හා 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූලායනය හා සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මුල්‍යායනය කිරීම සඳහා ණය ගිවිසුමේ එකඟ වූ මුදල් | | 2013 වාර්ෂික ඇස්තමේන්තු වේ වෙන් කරන ලද මුදල | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ණය 2639 - එස්ආර්අයි | 130 | 14,950 | 4,505 | 4,505 | 90.3 | 11,743 |
| ණය 2890 - එස්ආර්අයි (එස්එෆ්) | 68 | 8,840 | 322 | 317 | 2.6 | 335 |
| ණය 2891 - එස්ආර්අයි | 30 | 3,900 | - | 233 | 1.8 | 232 |
| ශ්‍රී ලං ර | 16 | 2,080 | 07 | 07 | 0.1 | 26 |
| | 244 | 29,770 | 4,834 | 5,062 | 94.8 | 12,336 |

ඉහත තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනට මාස 52 කින් මාස 40 ක් හෙවත් ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 76 ක් ඉකුත්වී තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට මුළු වෙන් කිරීමෙන් සියයට 38 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර, ඒ අනුව අනුමත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී වෙන්කිරීම්වල සමස්ත උපයෝජනය සැකසහිතය.

## 6.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුම් වලට අනුව උතුරු පළාතේ හා උතුරු මැද පළාතේ ජාතික මාර්ග කිලෝමීටර් 170 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. මාර්ග පුනරුත්ථාපනය හා පසු වර්ෂ තුනක් සඳහා මාර්ග නඩත්තු කිරීම සඳහා කොන්ත්‍රාත්තු පැකේජ අදියර දෙකකින් සමන්විත විය. ණය මුදලේ ආරම්භක විෂය පථය යටතේ මාර්ග 10 ක පුනරුත්ථාපන වැඩ 2013 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. කෙසේ වුවද කාර්ය සාධනය පදනම් කර ගත් මාර්ග නඩත්තු කාර්යයන් කාර්ය සාධනය නොමැතිවීම හේතුවෙන් විගණනයේදී විශ්වසනීය ලෙස ඇගයීමට නොහැකි විය.

(ආ) අතිරේක මුල්‍යායන වැඩ පිළිවෙල යටතේ සිදුකරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ වල ප්‍රගතිය පහත වගුවෙන් දැක්වේ.

| කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත් අංකය | ආරම්භක කළ දිනය | නිම කිරීම සඳහා අපේක්ෂිත දිනය | කොන්ත්‍රාත් වටිනාකම | 2013 දෙසැම්බර් 31 දිනට දරන ලද වියදම | 2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | | | | රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| A029- වවුනියාව - හොරොව්පතාන මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම | CP-11 | 2013 අගෝ. 24 | 2015 පෙබ. 20 | 990.41 | 242.65 | 11.0 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| B 283- මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම | CP- 12 | 2013 අගෝ.28 | 2015 පෙබ. 25 | 725.65 | 127.64 | 5.0 |
| B 283 - මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම | CP- 13 | 2013 අගෝ. 28 | 2015 පෙබ. 25 | 721.61 | 72.16 | 2.7 |
| B 211 කැබිතිගොල්ලෑව- පාදෙණිය මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම | CP- 14 | 2013 අගෝ. 28 | 2015 පෙබ. 25 | 885.27 | 103.38 | 2.2 |
| B 211 කැබිතිගොල්ලෑව- පදවිය මාර්ගය පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම | CP- 15 | 2013 අගෝ. 28 | 2015 පෙබ. 25 | 1,020.29 | 102.03 | 3.5 |

**6.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

ව්‍යාපෘතියේ ආරම්භක විෂය පථය යටතේ සිදුකරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල් යොදා ගනිමින් මහනුවර - යාපනය - A009 මාර්ගයේ කැකිරාව හා මරදන්කඩවල නගරයන්හි ස්ථානගතව පැවතුණු ජල නල සඳහා ආදේශ කිරීමට රු.36,054,386 ක් වූ යුපීවීසී හා ඩීඅයි නල හා සවිකිරීම් සැපයීමට හා බෙදාහැරීමට උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (උ මා ස ව්‍යා) විසින් භාර ගෙන තිබුණු අතර නල එළීමේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අධීක්ෂණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය විසින් ගිවිසුම්ගත බැඳීමකින් තොරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් එම වැඩ භාරගෙන තිබුණි. තවද දඹුල්ල - තෝනිගල මාර්ගය (සීපී-01) සහ තෝනිගල - ගල් කුලම මාර්ගය (සීපී - 02 ) පුනරුත්ථාපනය කිරීම සඳහා යෙදී සිටි කොන්ත්‍රාත්කරුවන් නල එළීමේ කාර්යයන් ක්‍රියාත්මක කරවීමට යොදවා සිටි අතර ඔවුන්ට විචලන නියෝගයන් මඟින් ගෙවීම් කර තිබුණි.

(ii) කැකිරාව නගරයේ කිලෝමීටර් 92 + 400 සිට කිලෝ මීටර් 93 + 500 දක්වා කොටසේ පුනරුත්ථාපන වැඩ, යුපීවීසී හා ඩීඅයි නල ප්‍රසම්පාදනය කිරීමෙන් පසු ඉවත් කර තිබුණි.

(iii) රු.4,781,562 ක් වටිනා නල අරමුණු කළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය නොකර අනුරාධපුර පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වැඩ බිම් රැස්වීම්වල සටහන්වලට අනුව ව්‍යාපෘතිය යටතේ සපයන ලද අතිරේක අරමුදල්වලින් සිදුකරන ලද සීපී 12, සීපී 17 , සීපී 15 , සීපී 13 පැකේජ යටතේ පුනරුත්ථාපන වැඩ පිළිබඳව පුහුණු හා නුපුහුණු ශ්‍රමය , අමු ද්‍රව්‍ය, පිරියත හා උපකරණ යනාදී කොන්ත්‍රාත්කරුවන් වෙත සම්පත් ප්‍රමාණාත්මක නොවීම හේතුවෙන් භෞතික ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක් වාර්තා කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සැලසුම් කරන ලද වැඩ සටහනට අනුව, වැඩ නිම කිරීම තහවුරු කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු හෝ ව්‍යාපෘතිය විසින් කිසිදු පිලියම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද සපයන ලද පූර්ව ආරක්ෂිත ක්‍රියාමාර්ගයන් හා සිදුකරන ලද ප්‍රවාහන පාලන වැඩ පිළිවෙලවල් සතුටුදායක නොවූ බව නිරීක්ෂණය විය. පැකේජ සීපී 13,14,15 යටතේ වැඩ 2013 අගෝස්තු 28 දින ආරම්භ කර තිබුණද, සංශෝධිත කාර්ය වැඩ සටහන , ක්‍රමවේද ප්‍රකාශනය සහ තත්ත්ව පාලන සැලැස්ම කොන්ත්‍රාත්කරු විසින් 2014 මාර්තු 01 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

### 6.3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දඹුල්ල - තෝනිගල මාර්ගයේ (සීපී-01 ) පුනරුත්ථාපන වැඩ වල යෙදී සිටි කොන්ත්‍රාත්කරුට පස්වලින් පිරවීම මත වූ ආරවුල විසඳීම සඳහා රු.1,063,163 ක මුදලක් ගෙවීමට බේරුම්කාර කමිටුවක් විසින් උපදෙස් දී තිබු බව විගණනයට අනාවරණය විය. කෙසේ වුවද, උපදේශකගේ අසතුටුදායක කාර්ය සාධනය හේතුවෙන් අදාළ ආරවුල පැන නැග තිබු බව තවදුරටත් නිරීක්ෂණය විය. උපදේශකගේ රාජකාරි ඉටුනොකිරීම වෙනුවෙන් ඔහුට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) මානිපායි සිට කයිතඩි මාර්ගය (සීපී-5 ) පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුව මුල් ස්ථරය (aggregate Base Course) සහ බැඳීම් ස්ථරය (wearing course ) ඇතිරීම සඳහා ප්‍රදානය කර තිබුණි. ප්‍රයිම් මතුපිට "ටැක් කෝට්" ආලේපය ඇතිරීම හේතුවෙන් ව්‍යාපෘති ඉංජිනේරුවන් සහ උපදේශකවරුන් විසින් ගෙවීම් සහතික කර නොතිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් පූර්ව අනුමැතිය නොමැතිව වැඩ විෂය පථය වෙනස් කිරීම පිළිබඳව අවධානයෙන් තොරව තාක්ෂණික ඇගයීම් කමිටුව හා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කොන්ත්‍රාත්කරුට රු.4,170,320 ක ගෙවීම කිරීම සඳහා උපදේශකගේ පසු එකඟතාවය සහිතව අනුමත කර තිබුණි.

(ඇ) වල්ලායි සිට අරාලි මාර්ගයේ (සීපී -06) කිලෝමීටර් 0 + 000 සිට කිලෝමීටර් 27 + 400 දක්වා පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2011 මැයි මාසයේදී ප්‍රදානය කර තිබුණු අතර, ආරක්ෂක කරුණු හේතුවෙන් පසුව කිලෝ මීටර් 4 +140 සිට 9 +200 දක්වා මාර්ග කොටස ඉවත් කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් ඉවත් කරන ලද මාර්ග වැඩ මත දරන ලද පොදු කාර්ය වියදම් සහ ඒ මත වාසිය සඳහා රු.45,489,420 ක් ඉල්ලා තිබු අතර ව්‍යාපෘතිය විසින් එම මුදල ගෙවා තිබුණි. මාර්ග වැඩ ආරම්භක අදියරේදී ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් නිශ්කාෂණයක් ලබාගෙන නොතිබු බව නිරීක්ෂණය විය. තවද වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම් රු.මිලියන 2.22 ක් පසුව ඉවත් කරන ලද වැඩවල ඇතුළත්වී තිබුණි.

(ඈ) වල්ලායි සිට අරාලි මාර්ගය (සීපී-06) පුනරුත්ථාපනය කිරීම සඳහා ලංසු ලියවිල්ල අනුව, මාර්ග පුනරුත්ථාපනය සඳහා පස් අවශ්‍යතාවය යාපනයේ හඳුනාගත් "borrow pits " වලින් ලබා ගත

යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුළු පස් අවශ්‍යතාවය පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් කිලිනොච්චියෙන් ප්‍රවාහනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් උපදේශකගේ එකඟතාවය ලබාගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට රු.29,831,919 ක් වූ ප්‍රවාහන පිරිවැය ගෙවා තිබුණි.

(ඉ) වල්ලායි සිට අරාලි මාර්ගයේ කිලෝ මීටර් 0+000 සිට කිලෝ මීටර් 27+400 දක්වා පුනරුත්ථාපනය කිරීම බොහෝ දුරට නිමකර තිබූ අතර කිලෝ මීටර් 9+220 - කිලෝ මීටර් 15+820 දක්වා මාර්ග මතුපිට මීටර් 10 සිට මීටර් 16.80 දක්වා පරාසයක දිගට ප්‍රධාන පිපිරීම් ඇතුළත්ව මාර්ග මතුපිට පිපිරීම් මතුවී තිබුණි. මෙම පිපිරීම් මාර්ග මතුපිට හරහා අවට භූමිය දක්වා වර්ධනයවී තිබුණි. ආසියානු සංවර්ධන බැංකුවේ සමාලෝචන දූත කණ්ඩායම 2013 ජූලි මාසයේදී පරීක්ෂා කිරීමට පැමිණි අතර පිපිරීම් පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් කිරීම සඳහා ස්වාධීන විශේෂඥවරුන් යෙදවීමටද උපදෙස් දෙන ලදි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් මාර්ග මතුපිට පිපිරීම් සඳහා හේතු විමර්ශනය කිරීමට ස්වාධීන විශේෂඥයින් යොදවා නොතිබුණි. තවද එකතු කරගත් පස් සාම්පල දෙකෙහිම මැටි සංයුතිය ඉතා වැඩි බව රසායනාගාර හා ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් දක්වා තිබුණි. එබැවින් පුනරුත්ථාපන වැඩ සැලසුම් කිරීමේ හා අධීක්ෂණය කිරීමේ අවස්ථාවේදී විධිමත් තත්ත්ව සහතික යාන්ත්‍රණයන් අනුගමනය කර නොතිබූ බව ප්‍රත්‍යක්ෂ වේ. තවද , මාර්ගය ධාවනයට සුදුසු බවට තහවුරු කර ගැනීම සඳහා පිළියම් ක්‍රියාමාර්ග ගනු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂගේ නිර්දේශය මත කොන්ත්‍රාත්කරු විසින් තාවකාලික නිවැරදි කිරීම් කර තිබුණි.

(ඊ) මාන්කුලම - මුලතිව් මාර්ගය (සීපී-08) පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවේ යෙදී සිටි කොන්ත්‍රාත්කරුට, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 14.5 උප වගන්තියෙන් අවශ්‍ය පරිදි වැඩ බිමේ ද්‍රව්‍ය ප්‍රමාණය තීරණය කිරීම සඳහා සහ ඉන්වොයිසි ආදිය මඟින් ඒවායේ වටිනාකම පරීක්ෂා කර තහවුරු කිරීමට භෞතික ගණනය කිරීමක් සිදුනොකර, වැඩ බිමේ අමු ද්‍රව්‍ය සඳහා සියයට 80 ක අත්තිකාරම් ලෙස රු.1,367,437 ක් ගෙවා තිබූ බව භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 4.3.1 වගන්තිය අනුව, ටෙලිකොම් කේබල් ඉවත් කිරීම හා යළි ස්ථානගත කිරීම වෙනුවෙන් ප්‍රමාණපත්‍රවල ටෙලිකොම් බදු හා සෙස් බදු සඳහා ප්‍රතිපාදන සිදු නොකළ යුතුය. කෙසේ වුවද වල්ලායි - අරාලි මාර්ගය (සීපී-06) හා දඹුල්ල - තෝනිගල මාර්ගය (සීපී-1) පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවට අදාළව දැනට පවත්නා ටෙලිකොම් ජාලය ඉවත් කිරීම හා යළි ස්ථානගත කිරීම සඳහා බදු ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත රු.1,245,325 ක මුදලක් ගෙවා තිබුණි.

(ඌ) මාන්කුලම - මුලතිව් මාර්ගයේ (සීපී - 7 සහ 9 ) පුනරුත්ථාපන වැඩ සිදු කිරීම් කාර්යයේදී කොන්ත්‍රාත්කරු විසින් නිශ්චිත තාක්ෂණික පිරිවිතරයන් අනුගමනය නොකිරීම හේතුවෙන් අඩුපාඩු වාර්තා වී තිබුණි. කෙසේ වුවද , කොන්ත්‍රාත්කරු විසින් එම අඩුපාඩු නිවැරදි කළේද යන්න තහවුරු කර ගැනීමට කිසිදු විධිමත් සාක්ෂියක් නොතිබුණි.

(එ) භාර ගැනීමේ සහතිකය නිකුත් කළ දින සිට ආරම්භ වන වර්ෂ තුනක කාල පරිච්ජේදයක් සඳහා මාර්ගය නඩත්තු කිරීම කොන්ත්‍රාත්කරුගෙන් අපේක්ෂා කෙරේ. ගෙවීම් කිරීම මාර්ගය නඩත්තු කිරීමේ සතුටුදායක තත්ත්වය මත පදනම් වේ. කාර්ය සාධනය මාසිකව ඇගයීම් කරන අතර කාර්ය සාධනයට අනුව ගෙවීම් සම්පූර්ණයෙන් හෝ කොටස් ලෙස සිදුකෙරේ. නඩත්තු වැඩ පිළිබඳ කාර්ය සාධනය තහවුරු කර ගැනීම සඳහා කාර්ය සාධන දර්ශකයන් යොදා ගත යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාර ගැනීමේ සහතික නිකුත් කිරීමෙන් පසු ඉතිරි වැඩ සිදුකිරීමට කොන්ත්‍රාත්කරුට ඉඩදී තිබීමෙන් කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන ලද නඩත්තු වැඩ පිළිබඳව හඳුනාගැනීම දුෂ්කර විය.

(ii) දෝෂ වගකීම් කාල පරිච්ඡේද තුළදී සිදුකරන ලද පුනරුත්ථාපන වැඩ වෙනුවෙන් මුදල් ඉල්ලීම වැළැක්වීම සඳහා වගන්තියක් කාර්ය සාධන පදනම් මාර්ග නඩත්තුව සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම්වල ඇතුළත් කර නොතිබුණි.